# ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබඳ විශ්වාසනීයත්ව දර්ශකය:

## විධායක සාරාංශය

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය - සෝෂල් ඉන්ඩිකේටර්
2023 ජනවාරි

# හැඳින්වීම

2023 පෙබරවාරි 4 වැනි දින ශ්‍රී ලංකාව සිය 75 වැනි නිදහස සමරයි. ආණ්ඩුවේ සැමරුම් මධ්‍යයේදී, පුරවැසියන් අධික ජීවන වියදම සහ ඖෂධ වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හිඟවීමේ දුෂ්කරතාවලට මුහුණ දෙමින් සිටියි. රජයේ ආර්ථික බර ලිහිල් කිරීම සඳහා, ගෘහස්ථ ආර්ථිකයට තවත් බලපෑම් කරමින් ඉහළ තීරුබදු සහ බදු පැනවීම් රජය විසින් යෝජනා කරයි. මේ පසුබිම යටතේ වර්තමානයේ විවාදයට ලක්වන පළාත් පාලන මැතිවරණය, ගෘහ ආර්ථික තත්වය සහ වික්‍රමසිංහ රජයේ ආර්ථික කළමනාකරණය පිළිබඳ මහජන තෘප්තිය යන ක්ෂේත්‍ර පිළිබඳ මහජන මතය ග්‍රහණය කර ගැනීමේ අරමුණින් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබඳ විශ්වාසනීයත්ව දර්ශකයේ සිව්වැනි අදියර පැවැත්විණි.

මෙම සමීක්ෂණය පවත්වන ලද්දේ, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි සමීක්ෂණ පර්යේෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් (SI) විසිනි. එය 1999 සිට ශ්‍රී ලංකාවේ පුළුල් පරාසයක සමාජ-දේශපාලනික ගැටළු පිළිබඳව ගුණාත්මක සහ ප්‍රමාණාත්මක පර්යේෂණ පවත්වනු ලබයි. සමීක්ෂණ පර්යේෂණ කණ්ඩායම ආචාර්ය ප්‍රදීප් පීරිස්, එම්. ක්‍රිෂ්ණමූර්ති, මුදිතා පතිරණ, ඉෂාරා ජයරත්න යන අයගෙන් සමන්විත විය. මෙම අධ්‍යයනය සිදු කිරීම සඳහා ලබා දුන් සහයෝගයට අපි ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තුට ස්තූතිවන්ත වෙමු.

# ක්‍රමවේදය

ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබඳ විශ්වාසනීයත්ව දර්ශකයෙහි සිව්වන අදියර, ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතරෙන් (සිංහල, දෙමළ, උඩරට දෙමළ, සහ මුස්ලිම්) නියැදි ප්‍රතිචාර දැක්වූවන් 1222 ගෙන් අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතා කර සිදු කරන ලදී. නියැදිය දිස්ත්‍රික්ක 25 තුළ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ දෙකෙහිම ස්ත්‍රීන් සහ පුරුෂයන්ගෙන් සමන්විත විය. ප්‍රතිචාර දැක්වූවන් තෝරාගැනීමට අහඹු නියැදීමේ ක්‍රමවේදය භාවිතා කර ඇති අතර, නියැදි ස්ථාන තෝරා ගැනීම සඳහා බහුඅදියර අහඹු ස්ථර නියැදි තාක්ෂණය භාවිතා කරන ලදී. මෙම ජාතික මත විමසීම සඳහා ක්ෂේත්‍ර කටයුතු 2023 ජනවාරි 12 දින සිට 18 දක්වා සෝෂල් ඉන්ඩිකේටර්හි දිවයින පුරා වූ ක්ෂේත්‍ර ජාලය යොදා ගනිමින් පවත්වන ලදී. ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතරෙන් ක්ෂේත්‍ර සමීක්ෂකයන් 78 ක් (පුරුෂ සහ ස්ත්‍රී) අධ්‍යයනයට සහභාගී වූහ. ජනගහනයේ සැබෑ දිස්ත්‍රික්කය සහ ජනවාර්ගික අනුපාතය පිළිබිඹු කිරීම සඳහා දත්ත කට්ටලය බර තබා ඇත. සමාජ විද්‍යාවන් සඳහා සංඛ්‍යාන පැකේජය (SPSS) භාවිතයෙන් දත්ත කට්ටලය විශ්ලේෂණය කරන ලදී.

# විධායක සාරාංශය

## ගෘහස්ථ ආර්ථිකය පිළිබඳ මතය

- මෙම සමීක්ෂණයෙන් 2022 ජූලි මාසයට සාපේක්ෂව ශ්‍රී ලාංකිකයන්ගේ ගෘහ ආර්ථික තත්ත්වය විමසා බලා ඇත. සැලකිය යුතු බහුතරයක් (79%) පවසන්නේ එය නරක අතට හැරී ඇති බවයි. මෙම නරක අතට හැරුණු ආර්ථික අත්දැකීම නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ දෙකෙන්ම පෙන්නුම් කෙරේ.

## ජනාධිපති වික්‍රමසිංහගේ ආර්ථික කළමනාකරණය පිළිබඳ තෘප්තිය/අතෘප්තිය

- ජනාධිපති රනිල් වික්‍රමසිංහ රටේ ආර්ථිකය කළමනාකරණය කරන ආකාරය පිළිබඳව පුරවැසියන්ගෙන් හතරෙන් තුනක් තමන් සෑහීමකට පත් නොවන බව (76%) ප්‍රකාශ කරන අතර, 16% පමණක් තමන් තෘප්තිමත් බව ප්‍රකාශ කරයි. මෙම අතෘප්තිමත්භාවය නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල මෙන්ම වයස් කාණ්ඩ දෙකෙහිම (අවුරුදු 30 ට අඩු සහ අවුරුදු 30 ට වැඩි) දක්නට හැකිය.

## රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සහය අපේක්ෂා කිරීම පිළිබඳ මතය

- රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය අපේක්ෂා කිරීම සම්බන්ධයෙන් ප්‍රතිචාරකයන්ගේ අදහස් මොනවාදැයි විමසූ විට, 29% ප්‍රකාශ කරන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය ඇතිව ශ්‍රී ලංකාවට ගොඩඒමට හැකි වනු ඇති බවත්, 56% ක් මෙම ප්‍රවේශය පිළිබඳ අශුභවාදී බවත් වේ. නාගරික ප්‍රදේශ (22%) හා සසඳන විට ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ශ්‍රී ලාංකිකයන් මෙම ප්‍රවේශය (31%) පිළිබඳ තරමක් ශුභවාදී වේ. වයස් කාණ්ඩ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි (IMF) සහය ඇතිව වුව ද (63%) ශ්‍රී ලංකාවට ගොඩ ඒමට නොහැකි බව ප්‍රකාශ කරන්නේ වැඩි වශයෙන් වයස අවුරුදු 30 ට අඩු තරුණ තරුණියන් ය.

## වික්‍රමසිංහ රජය යටතේ නව ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ මතය

- වික්‍රමසිංහ රජය යටතේ පවතින ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ මහජන මතය ද මෙම සමීක්ෂණයෙන් විමසන ලදී. සියලුම ශ්‍රී ලාංකිකයන් පාහේ (97%) විදුලි ගාස්තු වැඩි කිරීමට විරුද්ධ වේ. රජය නව බදු පැනවීම පිළිබඳව ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් (91%) සතුටු නොවන අතර 6%ක් ප්‍රකාශ කරන්නේ තමන් මෙම ප්‍රතිපත්තිය අනුමත කරන බවයි. රාජ්‍ය සේවක සංඛ්‍යාව අඩු කිරීම තමන් අනුමත කරන බව 39%ක් ප්‍රකාශ කරන අතර 54%ක් මෙම ප්‍රතිපත්තියට විරුද්ධ බව ප්‍රකාශ කරයි. ග්‍රාමීය සහ නාගරික

ප්‍රදේශ සහ වයස් කාණ්ඩ සම්බන්ධයෙන් ගත් කල, විදුලි ගාස්තු වැඩි කිරීම සහ නව බදු පැනවීම සැලකිය යුතු ප්‍රතිශතයක් අනුමත නොකරයි. සැලකිය යුතු කරුණක් නම්, නාගරික, ග්‍රාමීය ප්‍රදේශවලින් සහ වයස් කාණ්ඩ දෙකෙන්ම දළ වශයෙන් 40%ක් රාජ්‍ය සේවක සංඛ්‍යාව අඩු කිරීම අනුමත කරයි.

## පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිළිබඳ මතය

- ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආර්ථික අර්බුදකාරී තත්ත්වය සැලකිල්ලට ගෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සිය ජීවන රටාව ගෙනයන ආකාරය පිළිබඳව ප්‍රතිචාරකයන්ගෙන් විමසා සිටින ලදී. සමීක්ෂණ සොයාගැනීම්වලින් හෙළිවන්නේ ආණ්ඩුවේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන් බහුතරයක් අර්බුදයට පෙර ජීවත් වූ ආකාරයටම ඔවුන්ගේ සුඛෝපභෝගී ජීවන රටාව ගත කරන බව ශ්‍රී ලාංකිකයන් බොහෝ දෙනාගේ මතය බවයි. මෙම මතය නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ දෙකෙහිම සහ වයස් කාණ්ඩ දෙකෙහි (අවුරුදු 30 ට අඩු සහ අවුරුදු 30 ට වැඩි) දක්නට ලැබේ.

## පළාත් පාලන මැතිවරණය පිළිබඳ මතය

- වර්තමානය වන විට පළාත් පාලන මැතිවරණය සාකච්ඡාවට ලක් වී ඇති මාතෘකාවකි. එබැවින් පළාත් පාලන මැතිවරණය පැවැත්වීම සම්බන්ධයෙන් ඔවුන්ගේ මතය ප්‍රකාශ කරන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටින ලදී. පළාත් පාලන මැතිවරණය නියමිත වේලාවට පැවැත්විය යුතු බව 58%ක් ප්‍රකාශ කරන අතර, 21%ක් ප්‍රකාශ කරන්නේ එය කල් දැමිය යුතු බවයි. මෙම අදහස් නාගරික, ග්‍රාමීය ප්‍රදේශ සහ වයස් කාණ්ඩ දෙකෙහි (අවුරුදු 30 ට අඩු සහ අවුරුදු 30 ට වැඩි) දක්නට ඇත.

- පළාත් පාලන මැතිවරණය පැවැත්විය යුතු යැයි සිතන ජනතාව අතරින් 46%කගේ මතය වී ඇත්තේ වත්මන් රජයට ජනවරමක් / නීත්‍යානුකූල භාවයක් නොමැති බැවින් මැතිවරණය පැවැත්විය යුතු බවයි. ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමට මැතිවරණය වැදගත් බව 23%ක් ප්‍රකාශ කරන අතර, 21%කගේ මතය වන්නේ පළාත් පාලන මැතිවරණය දැනටමත් ප්‍රමාද වී ඇති බවත් එය බොහෝ කලකට පෙර පැවැත්වීමට නියමිතව තිබූ බවත්ය. මෙහි සඳහන් වන විශේෂත්වය නම් වත්මන් රජයට ජනවරමක් / නීත්‍යානුකූල භාවයක් නොමැති බවට බොහෝ දුරට අදහස් දක්වන්නේ වයස අවුරුදු 30ට අඩු තරුණ තරුණියන් (50%) වීමයි.

- මැතිවරණය කල් දැමිය යුතු යැයි ප්‍රකාශ කරන අය අතරින් බහුතරයකයගේ (71%) එකම මතය වන්නේ ආර්ථික අර්බුදකාරී තත්ත්වය යටතේ ආණ්ඩුව මැතිවරණයකට වියදම් නොකළ යුතු බවයි. මෙම මතය ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශ සහ වයස් කාණ්ඩ දෙකෙහි (අවුරුදු 30 ට අඩු සහ අවුරුදු 30 ට වැඩි) පොදුවේ දක්නට ලැබෙන මතයයි.

◆ ◆ ◆ ◆

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයක් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

ලිපිනය: නො. 6/5, ලෙයාර්ඩ්ස් පාර,
කොළඹ 5, ශ්‍රී ලංකාව.
දුරකථන: +94 11 208134/+94 11 208135 /+94 11 208136
ෆැක්ස් - +94 (11) 208138
වෙබ්: www.cpalanka.org
විද්‍යුත් තැපැල - info@cpalanka.org

සෝෂල් ඉන්ඩිකේටර් යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි (CPA) සමීක්ෂණ පර්යේෂණ ඒකකය වන අතර එය වර්ෂ 1999 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කෙරුණි. එමගින් සමාජ හා දේශපාලන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථිර, වෘත්තීය සහ ස්වාධීන සමීක්ෂණ මධ්‍යස්ථානයක් සඳහා දීර්ඝ කාලීනව පැවැති රික්තකයක් පුරවා ඇත. මත විමසීම් හරහා අදහස් ප්‍රකාශ කිරීම ප්‍රජාතන්ත්‍රවාදය සවිබල ගැන්වීමේ මෙවලමක්ය යන දැඩි විශ්වාසයෙන් යුක්තව සෝෂල් ඉන්ඩිකේටර් ආරම්භයේ සිටම සමාජ-ආර්ථික හා දේශපාලන ගැටළු රාශියක් පිළිබඳව මත විමසීම් පවත්වනු ලබයි.

ලිපිනය: නො. 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව.
දුරකථන: +94 11 2584050
වෙබ්: www.cpalanka.org.survey-research
විද්‍යුත් තැපැල - krishna@cpasocialindicator.org